**කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2023**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 1985 අංක 02 දරන පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 20 වන වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 570 | අදාළ කාර්යය නිමවී වර්ෂ 2 ක් ඉක්මවූ එකතු වටිනාකම රු.35,000 ක් වූ ටෙන්ඩර් තැන්පතු 2 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අදාල ආයතන වෙත ලිඛිතව දැනුම්දෙන ලද බවත් ඉදිරි මූල්‍ය කමිටුව සඳහා ඉදිරිපත්කර ආයතනයේ ආදායම සඳහා ලබාගැනීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 105 (2) | අස්ථානගත වී තිබුණු පොත් 808 ක් හා සඟරා 515 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු සිදු කර නොතිබුණි. | අදාළ විමර්ශන වාර්තාව කවුන්සිලය වෙත ඉදිරිපත් කල බවත්, කැලණිය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලයාධිපතිතුමාගේ අධීක්ෂණය යටතේ, පුස්තකාල පොත් සමීක්ෂණයක් සිදුකළ යුතු බවත්, එම සමීක්ෂණයේ වාර්තාව, කැලණිය කවුන්සිලය වෙත ඉදිරිපත් කළ යුතු බවත් තීරණය වූ බව. මේ වනවිට පුස්තකාල පොත් සමීක්ෂණය සිදුකිරීමට අදාළ මූලික කටයුතු සූදානම් කරමින් පවතින බව. | මුදල් රෙගුලාසි විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ | 2022 ජනවාරි 03 දිනැති අංක 01/2022 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ 4 (i) | පුස්තකාල පොත් එකතුව 100,000 ට අඩුනම් වාර්ෂිකව සමීක්ෂණය සිදුකළ යුතු වුවත් ආයතනයේ පුස්තකාල පොත් එකතුව 18,672 ක් සම්බන්ධයෙන් 2019 වර්ෂයෙන් පසුව සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | අස්ථානගතවූ පොත් හා සහරා සම්බන්ධ ගැටළුව විසඳෙන තෙක්, පුස්තකාල පොත් සමීක්ෂණයක් සිදු නොකරන ලෙස, 2022 ඔක්තෝම්බර් 12 වන දින පැවති 25 වන පුස්තකාල උපදේශන කමිටුවේදී තීරණය කළ බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2015 නොවැම්බර් 17 දිනැති අංක 15/2015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | 2023 වර්ෂයේ පවත්වන ලද උපාධි පාඨමාලා 5 ක විෂයන් 15 ක විභාග ප්‍රතිඵල නිකුත් කිරීමට මාස 3 සිට මාස 5 දක්වා කාලයක් ප්‍රමාද වී තිබුණි. | පැවරුම් ඉදිරිපත් කිරීමට නිර්දේශකර තිබූ දිනයන් විෂයභාර ආචාර්යවරුන් විසින් ශිෂ්‍ය ඉල්ලීම් මත දීර්ඝ කරනු ලැබ තිබීමත් ඇතැම් පරීක්ෂකවරුන් විදේශගතවීම නිසා සහ අයහපත් සෞඛ්‍ය තත්ත්වයන් නිසා අනුමත වෙනත් පරීක්ෂකවරුන්ට යොමුකර උත්තරපත්‍ර පරීක්ෂාකර ගැනීමට යාමත් නිසා යම් කාලයක් ගතවී තිබූ බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2014 පෙබරවාරි 11 දිනැති අංක 02/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 4(ii) | පර්යේෂණයන් ආරම්භ කළ දින සිට මාස 6 ක් තුළ එකී පර්යේෂණයේ ප්‍රගතිය පිළිබඳව අභ්‍යන්තර පර්යේෂණ වාර්තාවක් පර්යේෂණ කමිටුවට ඉදිරිපත් කර එකී කමිටුව විසින් ඉදිරියටත් පර්යේෂණ දීමනා ගෙවීම සඳහා අනුමත කිරීමකින් තොරව 2023 වර්ෂයේ නිලධාරීන් 9 දෙනෙකු වෙත පර්යේෂණ දීමනා ලෙස රු.4,447,297 ක් ගෙවා තිබුණි. | කිසියම් හෝ සාමූහික වගකීම්වල සිදුවූ ප්‍රමාද දෝෂයකින් මේ තත්ත්වය දිගින් දිගට සිදුවී ඇති බවත් මින් මතුවට එය නිවැරදි කිරීමට පියවර ගන්නා බව. | චක්‍රලේඛ විධිවිධාන පරිදි ක්‍රියා කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.21,929,331 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.3,181,409 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.18,747,922 ක පිරිහීමක් නිරීක්ෂණය විය. එම පිරිහීමට පුනරාවර්තක ප්‍රදාන අඩුවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුරාවිද්‍යා හා ආශ්‍රිත විෂයන්ගේ පර්යේෂණ සිදු කිරීමේ හා උසස් අධ්‍යාපනය ලබාදීමේ ආසියාවේ විශිෂ්ඨතම මධ්‍යස්ථානය වීමේ දැක්මෙන් කටයුතු කරනු ලබන පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයට 2023 වර්ෂයේදී කිසිදු විදේශීය ශිෂ්‍යයෙකු අධ්‍යාපන හෝ පර්යේෂණ කාර්යයන් සඳහා ලියාපදිංචි කරගෙන නොතිබුණි. දේශීය හා විදේශීය ශිෂ්‍ය ආකර්ශණය වැඩිකර ගැනීමට සුදුසු ප්‍රවර්ධන වැඩ පිළිවෙලක් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | නව පාඨමාලාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා Face book වැනි සමාජ මාධ්‍යයන් ඔස්සේ පාඨමාලාවන් පිළිබඳ විස්තර ඇතුළත් පුළුල් ප්‍රචාරයන් සිදු කරන ලද බව. | ආයතනය පිහිටුවීමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා වඩාත් සුදුසු ප්‍රවර්ධන වැඩසටහන් ප්‍රචාරණය කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ උපාධි පාඨමාලා 6 ක් වෙනුවෙන් සිසුන් 82 දෙනෙකු ලියාපදිංචි කරගෙන තිබුණු අතර සිසුන් 10 දෙනෙකු හෝ ඊට වඩා අඩුවෙන් ලියාපදිංචි වී තිබූ උපාධි පාඨමාලා ගණන 3ක් විය .පාඨමාලා සඳහා ශිෂ්‍ය ආකර්ශණය ඉතා පහළ මට්ටමක පැවති හෙයින් වැඩි ප්‍රමාණයක පාඨමාලා ආදායමෙන් මූලික පිරිවැය හෝ ආවරණයකර ගැනීමට නොහැකි වී තිබුණි. | පාඨමාලාවේ දේශන පවත්වාගෙන යාමට අවශ්‍ය අවම සිසුන් ගණන ලියාපදිංචි නොවන පාඨමාලාවන් අදාළ වර්ෂයේ නොපවත්වන අතර අදාළ පාඨමාලා පර්යේෂණ උපාධි පාඨමාලාවන් බව. | ශිෂ්‍ය ආකර්ෂණය වැඩිකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ගයක් ගත යුතුය. |
| (ඇ) | 2020 වර්ෂයේදී උපාධි නොවන පාඨමාලා 6ක් සඳහා සිසුන් 220 දෙනෙකු හා 2023 වර්ෂයේදී උපාධි නොවන පාඨමාලා 7ක් සඳහා සිසුන් 271 දෙනෙකු ලියාපදිංචි කර තිබුණු අතර 2021 හා 2022 වර්ෂවලදී සිසුන් ලියාපදිංචිවී නොතිබුණි. 2023 වර්ෂයේදී 2020 වර්ෂයට සාපේක්ෂව පාඨමාලා තුනක ශිෂ්‍ය ලියාපදිංචිය පහළ ගොස් තිබුණු අතර ඉන් එක පාඨමාලාවක් සඳහා කිසිදු සිසුවකු ලියාපදිංචි වී නොතිබුණි.<br><br>එමෙන්ම 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව උපාධි නොවන නව පාඨමාලාවන් 11ක් අළුතින් හඳුන්වාදීමට යෝජිතව පැවතියත් ඉන් කිසිදු පාඨමාලාවක් ආරම්භ කර නොතිබුණි. | 2023 වර්ෂයේදී බොහෝ අයදුම්කරුවන් විදේශගතවීම, රැකියා සහ උසස් අධ්‍යාපනය සඳහා යොමුවීම හේතුවෙන් අඩුවෙන් ලියාපදිංචි වී තිබූ Certificate Course in Cultural Tourism පාඨමාලාව සමග Diploma in Archaeology Cultural Tourism පාඨමාලාවට අනුගත කර විෂයමාලා සංවර්ධනය කර සංචාරක ක්ෂේත්‍රයේ රැකියාවල නියුතු මහපෙන්වන්නන් ආදී කණ්ඩායම් ඉලක්ක කරගෙන දේශන පවත්වාගෙන යනු ලබන බව. | කාලීන වැදගත්කමකින් යුතු වැඩි ඉල්ලුමක් ඇති පාඨමාලා හඳුන්වා දී ශිෂ්‍ය ආකර්ෂණය වැඩි කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | මෙම නව පාඨමාලා ආරම්භ කිරීම සඳහා ප්‍රමාණවත් අධ්‍යයන සහ අනධ්‍යන කාර්යමණ්ඩලවල සැලකිය යුතු හිඟයක් පවතින හෙයින් මෙම පාඨමාලා ආරම්භ කිරීමට ප්‍රමාද වූ බව. | |
| (ඇ) | පර්යේෂණ නිබන්ධන ඉදිරිපත් කරන ලද සිසුන් 29 දෙනෙකු සම්බන්ධයෙන් සිදුකළ නියැදි පරීක්ෂාවේදී අවස්ථා 13කදී සිසුන් විසින් ආයතනයට භාරදෙන ලද පර්යේෂණ නිබන්ධන පරීක්ෂකවරුන් වෙත ලබාදීමට දින 30 සිට දින 91දක්වා කාලයක් ගතකර තිබුණි. එමෙන්ම පරීක්ෂා කිරීම සඳහා පළමු, දෙවන හා තෙවන පරීක්ෂකවරුන් වෙත ලබාදී තිබුණු නිබන්ධන පරීක්ෂා කර නැවත ඉදිරිපත් කිරීමේදී දින 90 කට වැඩියෙන් ගතකර තිබුණු අවස්ථා 14ක් පැවතුණි. | උපාධි නිබන්ධන භාරදුන් මාසයේදී අධ්‍යයන මණ්ඩලය රැස්නොවූයේ නම් එළඹෙන මාසයේ පවත්වනු ලබන අධ්‍යයන මණ්ඩලය මඟින් පරීක්ෂකවරුන් පත්කිරීමට සිදුවේ එමෙන්ම ඇතැම් අවස්ථාවලදී පත්කරනු ලබන පරීක්ෂකවරුන් උපාධි නිබන්ධන පරීක්ෂා කිරීම ප්‍රතික්ෂේප කළවිට නැවත පරීක්ෂකවරයෙක් පත්කිරීම සඳහා ඊළඟ අධ්‍යයන මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතු වේ. ඉහත සඳහන් පරීක්ෂකවරුන් පත්කිරීමේ අධ්‍යයන පටිපාටිය නිර්දේශිත ක්‍රියාවලියක් බැවින් එය මගහැර හෝ තවදුරටත් වෙනස් කළ නොහැක. | විධිමත් කාල රාමුවක් යටතේ පරීක්ෂාකර ප්‍රතිඵල පමාවකින් තොරව ලබා ගැනීමට කටයුතු කිරීම. |